

# කස්තිරම

## ඩී බී කුරුප්පු

# අපේ ගුවන් විදුලිය ගැනයි.....

මා මේ මාතෘකාව ගැන ලියන දෙවැනි වතාව ය. ගිය අවුරුද්දේ අග හරියේ ලියූ ලිපිය මත භේදයට තුඩු දුන් බව මට මතක ය. එම මත භේද නොහොත් චෝදනා ප්‍රශ්න වශයෙන් කෙළින්ම මා වෙත ඉදිරිපත් කිරීමට 3ZZZ සිංහල සේවයේ බලධාරීන් කල්පනා කළ බව සඳහන් කරන්නේ කෘතවේදීව ය. මම එය බෙහෙවින් අගය කරමි.

පොඩි ප්‍රශ්නයක් වන්නේ මගේ "වේණා ගායනාව" කිසිවකු ගේ කණට නොවැටී සුළඟේ පා වී යාම ය. නැවත වතාවක් ලියන්නට සිතුවේ අන්න ඒ නිසා ය. මා කියන දේ ඇසීමට - පිළිපැදීමට - කිසිවකු බැඳී සිටින නිසාවෙන් නොවේ.

ගිය වතාවේ මගෙන් ඇසූ ප්‍රශ්න දෙකක් විය.

පළමුව එම ලිපිය කල් යල් බලා පළ කළ එකක්ද යන්න ය. ඒ කියන්නේ එය පළවූයේ ගුවන් විදුලි සේවයේ සාමාජිකයන්ගේ වාර්ෂික රැස්වීමට ඔන්න මෙන්න කියා ය. ඒ බව මා නොදත් බව කීවෙමි. දැනගත්තත් තත්වයේ වෙනසක් වෙනවාට නොවේ.

දෙවැනි ප්‍රශ්නය ඊට වඩා දරුණු ය. මට රිදෙන විදියේ ප්‍රශ්නයකි. මුළු ලිපියම ලියුවේ මා ද - නැතහොත් කොටසක් වෙන කෙනකු අතින් ලියවුණා ද යන්න ය. කිසි එකකුට මගේ නමින් ලියන්නට නොදෙන බව කීමට වඩා ඇඟට වදින උත්තරයක් දී ගන්නට මම අපොහොසත් වූයෙමි.

වසර දහසයක් දාහතක් තිස්සේ අපේ ඉරිදා ප්‍රජා ගුවන් විදුලි සේවයට (එනම් 3ZZZ) සවන් දී ඇති මම අද එය වැටී ඇති තත්වය ගැන සැබැවින්ම දුක් වන්නෙමි. මගේ මිනුම් දණ්ඩ වැරදි විය හැකි ය. එහෙත් ඒ මිම්මට අනුව නම් අද තරම් එය පහත වැටුණ අවදියක් නොවී ය. මගේ ඒ කණගාටුව තවත් වැඩි වන්නේ එය පවත්වා ගෙන යන පිරිස සතුව ඇති - ඔවුන්ට උපයෝගී කරගත හැකි - අපමණ සම්පත් අප ප්‍රජාව තුළ පවත්නා බව කල්පනා කරන විට ය.

මෙබඳු සත් කාර්යයක් ඉටු කිරීමේදී ස්වේච්ඡාවෙන් හෝ වැටුප තකා හෝ ක්‍රියා කරන පිරිස දෙගොඩකට බෙදිය හැකි යයි සිතමි. කරන - කරවන දෙපිරිස හැටියට ය. මෙසේ බෙදන කල්හි මට මතක් වන්නේ ශ්‍රී ලංකාවේ දේශපාලන නායකයෙකි. නමින් ආර් ප්‍රේමදාස නම් වූ ඔහු අගමැති පුටුවටත් ජනාධිපති පුටුවටත් හිමිකම් කී උගත්කමින් අඩුම දේශපාලකයා යයි සිතමි. ඔහුගේ පාලන ශෛලියත් ඔහු සේවකයන්ට සැලකූ ආකාරයත් අනුමත නොකරන්නෝ ද වෙති. එහෙත් ඒ සියලු දෙනාම එක හෙළා පිළිගන්නා සත්‍යයක් ඇත . එනම් ඔහු යටතේ ශ්‍රී ලංකාවේ පරිපාලනය නිදි කිරුවේ නැති බව ය. බෙහෙවින් කාර්යශීලී වූ බව ය.

මිනිසුන්ගෙන් වැඩ ගැනීමෙහි ලා ප්‍රේමදාස තරම් සමතෙක් ශ්‍රී ලංකා දේශපාලනයේ නොසිටියේ ය. එසේ වැඩ ගැනීමේ දී වැඩට සුදුසු පුද්ගලයන් තෝරා ගැනීම ඔවුන්ට නිසි මග පෙන්වීම සහ අවශ්‍ය පසු විපරම ද අත්‍යවශ්‍ය ය. සමහර විට ඔහු තෝරා ගත්තේ තමාට සමීප - තමාට අවනත පුද්ගලයන් ය. එහෙත් එබන්දන්ගෙන් පවා උපරිම සේවයක් උකහා ගැනීමේ පුදුම හපන්කමක් ඔහුට තිබුණේ ය.



Graphic thought by - Saamantha Tennege

ප්‍රේමදාස නිදර්ශනයට අනුව කල්පනා කරතොත් අපේ ගුවන් විදුලි සේවයේ දුබලතා හඳුනා ගැනීම පහසු වෙතැයි ද සිතමි. ගුවන් විදුලිය හසුරුවන්නට හැම කෙනෙකුටම බැරි ය. හැසිරවීම යනුවෙන් මෙහි දී මා අදහස් කරන්නේ ගුවනින් කතා කරමින් එය ක්‍රියාවට නැංවීම ය. එය කරන්නට නම් ගුවන් විදුලියට උචිත හඬක් පමණක් නොව කතා විලාසයක් ද තිබිය යුතු ය. කෙසේ හෝ හැම කෙනෙක්ම එම වාසනා ගුණයෙන් යුතු වූවෝ නොවෙති.

මාත් වැටෙන්නේ එම අසාර්ථක ගොඩට ය. ඉඳ හිට පිළිසඳරකට සහභාගි වුවත් මට එය මෙහෙයවීම බැරි බව මම දනිමි.

ගුවන් විදුලිය කරවන උදවිය තමන් ගැනම මෙන්න මේ තක්සේරුව කිරීමට සමත් විය යුතු ය - සමත්වීම පමණක් නොවේ. එසේ කිරීමට තරම් නිහතමානයකින් ද යුතු වීම අවශ්‍ය ය. එසේ වූ කල්හි එයට අත ගැසීමට හැකියාවක් නොහොත් උපන් හපන්කමක් ඇති පිරිසක් තෝරා බේරා ගැනීමට ඔවුන් සමත් වනු ඇත. වක්කඩ කැඩුවා වාගේ කතා කිරීම පමණක් වැඩ සටහනක් සාර්ථක වීමට සාධකයක් නොවන බව අවධාරණය කළ යුතු ය. මට නිදසුනක් මතක් වෙයි. සිංහල කතා කිරීමේ ඒ තරම් දක්ෂයකු යයි කිව නොහැකි එල්මෝ පෙරේරා කලක් මෙල්බර්න් එස්බීඑස් සේවය බාරව කටයුතු කළේ ය. ඔහුගේ බස දුර්වල යයි කිව හැකි වුවත් ඒ විනාඩි හැට තුළ මනා සංවිධානයකින් යුතුව අනවශ්‍ය විච්චූරණ රහිතව ඔහු ඉදිරිපත් කළ ගුවන් විදුලි වැඩ සටහනට ළං විය හැකි පැය දෙකේ වැඩ සටහනක් පවා මා අසා නැති බව සඳහන් කරමි.

**ගුවන් විදුලිය කරවන උදවිය තමන් ගැනම මෙන්න මේ තක්සේරුව කිරීමට සමත් විය යුතු ය - සමත්වීම පමණක් නොවේ. එසේ කිරීමට තරම් නිහතමානයකින් ද යුතු වීම අවශ්‍ය ය. එසේ වූ කල්හි එයට අත ගැසීමට හැකියාවක් නොහොත් උපන් හපන්කමක් ඇති පිරිසක් තෝරා බේරා ගැනීමට ඔවුන් සමත් වනු ඇත. වක්කඩ කැඩුවා වාගේ කතා කිරීම පමණක් වැඩ සටහනක් සාර්ථක වීමට සාධකයක් නොවන බව අවධාරණය කළ යුතු ය. මට නිදසුනක් මතක් වෙයි.**

මා දුටුවේ අවශ්‍ය අංග මනාව තෝරා ගන්නා ඔහු එකදු විනාඩියක් අපතේ නොහළ බව ය. ඒ අතරේ ඉංගිරිසි ප්‍රවෘත්ති සාරාංශයක් ඉදිරිපත් කිරීමට ද ඔහු සමත් විය.

මට පෙනෙන විදියට අද දවසේ ගුවන් විදුලියට අන්තර්ජාලයේ අභියෝග යට ද මුහුණ දීමට සිදු වන්නේ ය. ගුවන් විදුලියෙන් හුදෙක් ප්‍රවෘත්ති නිවේදනය කිරීම අර්ථ විරහිත තත්වයට වැටෙන්නේ ඒ සියල්ලක්ම ඊටත් කලින් බොහෝ දෙනාට අන්තර්ජාලයෙන් දැන ගත හැකි නිසා ය.

කවි ගී හා නාටක ආදිය මගින් ශ්‍රාවකයාට පිරිනමන වින්දනය හා විනෝදයට අමතර ව එදිනෙදා සිදුවීම් පිළිබඳ විස්තරයකට වඩා සියුම් විදියේ විවරණයක් විශ්ලේෂණයක් ඔවුන්ට පිරිනමන පිළිසඳර සහ වෙනත් වැඩ සටහන් සංවිධානය කිරීම මෙහිලා බලධාරීන්ට පැවරෙන බැරෑරුම් වගකීමක් වන්නේ ය. මෑතකදී ප්‍රසන්න කුරුකුලරත්න ගේ "විමසුම" නවතාලීම ගැන කතා කළ යුත්තේ ඒ නිසා ය.

එය අත්හිටුවීමට සාධාරණ හේතු තිබුණු බව බලධාරීහු විශ්වාස කරති. යටත් පිරිසෙයින් මට දැනගන්නට ලැබුණේ එසේ ය. ඔවුන්ගේ තර්ක බැලූ බැල්මට සාධාරණ සෑටියක් ද පෙනෙයි. එහෙත් විමසුමක් කරන්නා හුදු වාර්තා සපයන්නෙක් නොවේ. තමාගේ නිරීක්ෂණ පමණක් නොව විවේචන හා නිගමනත් ඉදිරිපත් කිරීමට ඔහු පසුබට වන්නේ නම් එය විමසුමක් නොවනු ඇත. එසේ අදහස් ප්‍රකාශනයේදී බලධාරීන් අනුමත නොකරන මත හා විවේචන ඉදිරිපත් වීම ද අනිවාර්යය. එසේ සිදුවන කල්හි අනුගමනය කළ හැකි නුවණට හුරු පිළිවෙත වන්නේ එබඳු අදහස් ඔස්සේ පැවැත්වෙන සංවාදයකට සාකච්ඡාවකට වේදිකාවක් ගුවන් විදුලිය ඔස්සේ සැපයීම ය. එමගින් ශ්‍රාවක සහභාගිත්වය ද වර්ධනය කර ගැනීමට අවසර ලැබෙයි. ශ්‍රාවක අවධානය ගුවන් විදුලියට යොමුකර ගැනීමද එමගින් පහසු වෙතැයි සිතමි.

අවසාන වශයෙන් කිව යුත්තේ මේ වැඩ සටහන ඉදිරිපත් කිරීමේ වගකීම දරන්නන් එක්තරා ආත්ම විශ්ලේෂණයකට - තමන් ගැන ම තක්සේරුවක් කිරීමට - යොමු විය යුතු බවය. එසේ කළ හැකි නම් එය ඔවුන්ගේත් ශ්‍රාවකයන්ගේත් යහපත සඳහා වන බව මම විශ්වාස කරමි.